# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1671 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 04 /11 /2024 පැය 0545

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවන් 08 දෙනෙකු අත්අඩංගුවට -මාතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.09.19 වන දින මිදිගම පොලිස් වසමේ ගොවියාපාන ප්‍රදේශයේදී යතුරු පැදියකින් පැමිණ ගිනි අවි වලින් වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කර තවත් දෙදෙනෙකුට බරපතල තුවාල සිදුකිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් මාතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මගින් විමර්ශන ආරම්භ කර තිබුණි.

මෙම ඝාතනයට යතුරු පැදියෙන් පැමිණ පිස්තෝල අවියකින් වෙඩි තැබීම සිදුකළ සැකකරු, අපරාධයෙන් පසු එම අවිය සහ පතරොම් 05 ක් ළඟ තබා ගෙන සිටි සැකකරුවෙකු සහ අපරාධයට ආධාර අනුබල දුන් තවත් සැකකරුවන් 05 දෙනෙකු සහ සැකකාරියක් 2024.11.03 වන දින වැල්ලවාය, අහංගම හා මිදිගම ප්‍රදේශවලදී මාතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන මාතර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. වෙඩි තැබීමෙන් පසු අවිය ප්‍රවාහනය සඳහා යොදා ගත් ත්‍රිරෝද රථයද පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 20 ත් 42 ත් අතර වයස්වල පසුවන අහංගම, වැලිගම හා වැල්ලවාය ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර, සැකකාරිය වයස අවුරුදු 41 ක් වන අහංගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පිස්තෝල අවිය සන්තකයේ තබා ගෙන සිටි සැකකරු සන්තකයේ තිබී හෙරොයින් ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 1,542,000/- පොලිස් භාරයට ගෙන ඇති අතර, මොහු විදේශ රටක සිට මෙරට සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුකරනු ලබන පුද්ගලයෙකුගේ සමීපතමෙයෙකු බවට අනාවරණය වී ඇත. මාතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**